@

රිවිර
ඉරිදා සංග්‍රහය

රිවිර
පුවත්
දිවි මංසල
ජනසෙත
දේශපාලන
නවකතාව
විශේෂාංග
විමර්ශන
කතුවැකිය
කාටූන්
ගුණ දොස්
රණබිම
දේශපාලන සාකච්ඡා
ක්‍රීඩා
වත්කම
අරුණැල්ල
චිත්‍රකතාව
රිවිදහර
රිවිනෙත
රිවිතරණ
රිවිසරසි

ළාබාල සිව් දෙනකු සමග පරිගණක ආම්පන්න දැලේ

තාක්ෂණේ සාට්ටුවෙන් මුද්‍රණය කළ

# රුපියල් දාහේ අලුත්ම අලුත් හොර නෝට්ටු මගඩියත් මාට්ටු



අලුත්ම අලුත් රුපියල් දහසේ නෝට්ටුව ශ්‍රී ලංකාවට හඳුන්වා දී තවමත් දෙතුන් මාසයකට වැඩි කාලයක් ගත වී නැත. එමෙන්ම තවමත් ලංකාවේ ජනගහණයෙන් සැලකිය යුතු පිරිසකට මේ අලුත් දාහේ නෝට්ටුව ගැන එතරම් දැනුමක් හෝ අවබෝධයක් ද නැත. සමහර කඩ වලට මේ අලුත් දාහේ නෝට්ටුව දුන් විට මුදලාලිලා පවා උඩ බිම බලන්නේ මේ නිසා විය යුතුය.

මෙන්න මේ නොදැනුවත්කම දඩමීමා කරගෙන පටන් ගත් බව කියන අලුත් දාහේ නෝට්ටු හොරට මුද්‍රණය කිරිමේ කූට ජාවාරමක් පිළිබඳව තොරතුරු හෙළි කර ගැනීමට පසුගිය දා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ව්‍යාජ මුදල් අංශයට හැකියාව ලැබුණි. මෙහි ඇති විශේෂම කාරණය වන්නේ මේ කූට ව්‍යාපාරය පටන් ගෙන ඇත්තේ රුපියල් දාහේ නෝට්ටුව ලංකාවට හඳුන්වා දී මාසයක්වත් ගත වීමට මත්තෙන් වීමයි. කෙසේ වුවත් මේ හොර සල්ලි අච්චු ගැසීමේ සිද්ධිය සම්බන්ධයෙන් සැක පිට මේ වන විට පුද්ගලයන් සිව් දෙනකු අත්අඩංගුවට ගැනීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ක්‍රියා කළේය. ඒ සමග ඔවුන් ඒ සඳහා පාවිච්චි කළ පරිගණක කට්ටලයක් ද ආම්පන්න කට්ටලයක් ද අත්අඩංගුවට ගෙන ඇත.

මේ 'හොර සල්ලි' මගඩිය හසුවීමට සුලමුල පෑදී ඇත්තේ කොළඹ කොටුව ප්‍රදේශයේ ආපන ශාලා හිමියකුගෙනි. නිතරම ඔහුගේ ආපන ශාලාවට එන තරුණයන් දෙදෙනකු දාහේ කොළවලින් පමණක් මුදල් ගෙවන බව එම ආපනශාලා හිමිකරුට වැටහුණි. ඒ දාහේ කොළ සියල්ලම මේ නොබෝදා මුද්‍රණය කිරීම ඇරඹුණු අලුත් දාහේ කොළ ම විය. එම ව්‍යාපාරිකයාට මේ ගැන සැකයක් ඉපැදී තිබුණි. මේ නිසා ඔහු මේ ගැන කොටුව පොලිසියට පැමිණිලි කළේය. ඒ අනුව ක්‍රියාත්මක වූ කොටුව පොලිසියේ නිලධාරිහු පෙර කී තරුණයන් දෙදෙනා පරීක්ෂාවට භාජනය කළහ. එහිදී ඔවුන් සතුව තිබී ව්‍යාජ නෝට්ටු තුනක් තමන් භාරයට ගැනීමට කොටුව පොලිසියේ නිලධාරිහු සමත් වූහ.

මොවුන් දෙදෙනා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ව්‍යාජ මුදල් අංශයට යොමු කෙරුණේ එයින් අනතුරුවය.

එහිදී ඔවුන් හෙළි කළ තොරතුරු අනුව ව්‍යාජ මුදල් අංශයේ නිලධාරිහු මහරගම ප්‍රදේශයේදී තවත් පුද්ගලයකු අත්අඩංගුවට ගත්හ. මෙම හොර සල්ලි මුද්‍රණය කිරීමේ ජාවාරමට පාවිච්චි කළේ යැයි සැක කෙරෙන පරිගණක කට්ටලක් ද ආම්පන්න කිහිපයක් ද අත්අඩංගුවට ගැනීමට පොලිසියට හැකි වුණේ මහරගමදී අත්අඩංගුවට ගත් එම පුද්ගලයා හෙළි කළ තොරතුරු අනුවය. එම සියලුම දේ තිබුණේ ඔහුගේ නිවසේය. එමෙන්ම ඔවුන්ගේ හොර සල්ලි මාරු කිරීමට උදව් වූ බවට සැක කෙරෙන බස් කොන්දොස්තරවරයකු ද පොලිස් අත්අඩංගුවට පත් විය.

ඔවුන් මෙම හොර සල්ලි මුද්‍රණය සඳහා භාවිත කර තිබුණු තාක්ෂණය ඉතාම සූක්ෂම එකකි. පරිගණකයක ආධාරයෙන් නිම වුණු නෝට්ටු මුද්‍රණය කොට තිබුණේ ලේසර් ප්‍රින්ටරයකිනි. ඒ4 කඩදාසි මත මේ හොර නෝට්ටු මුද්‍රණය කර තිබුණු අතර නෝට්ටුවේ පැති දෙකම වෙන වෙනම මුද්‍රණය කොට පසුව එකට අලවා තිබුණි. එක් ඒ4 කඩදාසියක හොර නෝට්ටු තුනක් මුද්‍රණය කරන ආකාරයට ඔවුන් මෙය සැලසුම් කොට තිබුණි. එමෙන්ම මුදල් නෝට්ටුවල පවතින ඊයම් පටි හා දිය සලකුණු ද කිසිදු ඇද පලුද්දකින් තොරව මෙම හොර නෝට්ටුවල ද තිබෙනු දකින්නට ලැබුණි. ඊයම් පටිය හොර නොට්ටුවට එක් කිරීම සඳහා ඔවුන් අනුගමනය කොට තිබුණු ක්‍රමවේදය ඉතාම සියුම් එකක් විය. ඒ4 කඩදාසියේ මුද්‍රණය කරන නෝට්ටුවේ එක් මුහුණතක ඉතාම සියුම් පිහියක් ආධාරයෙන් කැපුම් සිදු කොට තිබුණි. නෝට්ටුවේ අනෙක් මුහුණත අලවන්නට පෙර ඒ දෙක මැද්දෙන් ඒ කැපුමට සරිලන පරිදි ඊයම් පටියක් අලවන්නට මෙම හොර නෝට්ටු නිර්මාණකරුවන් ක්‍රියා කොට තිබුණි. ඒ අනුව බැලූ බැල්මට පෙනෙන්නේ නෝට්ටුවේ එක් මුහුණතක ඊයම් රේඛාවක් ගමන් කරන බවය.

එමෙන්ම දිය සලකුණු ද කිසිම වෙනසකින් තොරව මෙම හොර නෝට්ටුවල සලකුණු වී ඇත. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින් පවසන්නේ ස්ටෙන්සිල් එකක් ආධාරයෙන් ඔවුන් මේ දිය සලකුණු පැන්සලකින් ඇඳ ඇති බවයි. ඒ නෝට්ටුවේ එක් මුහුණතක ඇතුල් පැත්තේය. එවිට ආලෝකයට අල්ලා බැලූ විට දිය සලකුණක් ලස්සනට දිස් වේ. මෙම හොර නෝට්ටු අලවා ඇත්තේ ද ඉතාම සියුම් අන්දමිනි. ඒ සඳහා ඔවුන් භාවිත කොට ඇත්තේ අඩිකෝදුවකි. නෝට්ටුවේ දෙපැත්ත ගෙන එකට තබා කිසිම රැල්ලක් නොසිටින ආකාරයට අඩිකෝදුවක් මගින් එය සමතලා කරමින් ඉතාම සීරුවට මෙම නෝට්ටු අලවා ඇත.

මේ සියල්ලෙන්ම පෙනී යන්නේ මේ හොර නෝට්ටුවේ නිර්මාණකරුවන් ඉතාමත් සූක්ෂමව සහ සැලසුම් සහගතව මෙය නිමවා ඇති බවයි. මෙහි තවත් විශේෂත්වයක් වන්නේ මෙම සැකකරුවන් දෙනාම ඉතාමත් ළාබාල වයසේ පසු වීමයි. මෙයින් එක් අයකු තවමත් පාසල් සිසුවකු වන 19 හැවිරිදි තරුණයෙකි. තවත් සැකකරුවෙකු 21 හැවිරිදි වන අතර ඉතිරි දෙදෙනා 23 වන වියේ පසුවෙති.

මෙම සැකකරුවන්ගෙන් පොලිසිය ප්‍රශ්න කිරීමේදී ඔවුන් හෙළිදරව් කොට ඇත්තේ මෙවැනි දෙයක් කිරීමට පෙළඹුණේ ආර්ථික ප්‍රශ්න නිසා බවයි. තමන් දැන්වීම් නියෝජිත ආයතනයක් පවත්වාගෙන යන බවත් එහෙත් එයට අවශ්‍ය ප්‍රාග්ධනය සපයා ගැනීමට මෙලෙස හොර නෝට්ටු මුද්‍රණය කළ බවත් ඔවුන් පොලිසියට පාපොච්චාරණය කොට ඇත.

මෙම හොර නෝට්ටු ජාවාරමෙන් අදාළ සැකකරුවන් රුපියල් ලක්ෂ දෙකක පමණ මුදලක් හොරට මුද්‍රණය කොට ඇතැයි රහස් පොලිසිය කියයි. ඒ අනුව හොර නෝට්ටු 200ක් පමණ මෙම පිරිස අතින් මුද්‍රණය වී ඇති බව රහස් පොලිසියෙන් ව්‍යාජ මුදල් අංශයේ අදහසයි. මේ අතරින් අති විශාල මුදල් නෝට්ටු සංඛ්‍යාවක් මොවුන් සමාජයට මුදා හැර ඇති බවත් ඒවා දැනටත් සංසරණය වන බවටත් රහස් පොලිසියේ ව්‍යාජ මුදල් අංශයේ නිලධාරිහු අනුමාන කරති.

මේ අනුව මහරගම, හෝමාගම, රත්මලාන, කටුබැද්ද සහ නුගේගොඩ යන ප්‍රදේශවල මෙම ව්‍යාජ මුදල් සංසරණය වන බව එම නිලධාරිහු ප්‍රකාශ කරති. ඔවුන් කියන්නේ මෙම හොර නෝට්ටු හඳුනා ගැනීම අතිශයින්ම දුෂ්කර බවයි. එම නිසා අලුත් රුපියල් දාහේ නෝට්ටුවක් ලැබුණොත් එය ඉතාම සැලකිල්ලෙන් යුතුව පරීක්ෂා කර බලන ලෙසත් ඔවුහු ජනතාවගෙන් ඉල්ලා සිටිති.

මෙම හොර මුදල් නෝට්ටු හඳුනා ගැනීමට ඇත්තේ එකම එක ක්‍රමයක් පමණි. එනම් ඉතාමත් සමීපව සහ අරපරිස්සමෙන් යුතුව එය පරීක්ෂා කර බැලීමයි. නියම ආකාරයට මුද්‍රණය කළ රුපියල් දාහේ නෝට්ටුවක රූප අතරත් මේ ව්‍යාජ නෝට්ටුවේ ඇති රූප අතරත් කිසියම් වෙනසක් නිරීක්ෂණය කර ගන්නට පුළුවන. ව්‍යාජ නෝට්ටුවේ රූපවල කිසියම් අපැහැදිලිතාවක්, බොඳ වූ ස්වභාවයක් පෙනේ. එය හරිහැටිම නිරීක්ෂණය කළ හැකි වන්නේ ව්‍යාජ නෝට්ටුව සැබෑ නෝට්ටුවක් සමග එකට තබා සංසන්දනය කළ පසුවය.

මෙම සැකකරුවන් පොලිසියට පාපොච්චාරණය කර ඇත්තේ ද තමන් මේ කාර්යය සඳහා රුපියල් දාහේ නෝට්ටුවම තෝරා ගත්තේ එය තවමත් ජනතාවට පුරුදු නැති නිසා බවයි. ජනතාවට හොඳින් හුරු මුදල් නෝට්ටුවක් ව්‍යාජ ආකාරයට මුද්‍රණය කළහොත් වැඩි අපහසුවකින් තොරව එය හඳුනා ගන්නට හැකියාව ලැබේ. නමුත් එතරම් හුරුපුරුදු නැති මෙවැනි

අලුත් නෝට්ටුවක් හොරට මුද්‍රණය කළහොත් එය අසු කර ගැනීම අපහසුයි. කොටින්ම බැංකුවලට පවා මෙවැනි හොර නෝට්ටු හඳුනාගත හැකිවේදැයි සැක සහිත බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ව්‍යාජ මුදල් අංශයේ නිලධාරිහු ප්‍රකාශ කරති.

එසේ වුණත් එය කිසිවකුටත් නිදහසට කාරණයක් නොවේ. මෙවැනි මුදල් නෝට්ටුවක් දැනුවත්ව හෝ නොදැනුවත්ව ළඟ තබාගෙන සිටින කිසියම් පුද්ගලයකු වෙයි ද ඔහු නීතිය හමුවේ වැරදිකරුවෙකි. පෙර කී නිදහසට කරුණු ඉදිරිපත් කොට එයින් ගැළවෙන්නට ඔවුන්ට පුළුවන්කමක් නැත. එම නිසා සිදු කළ යුතු වැදගත්ම දෙය නම් මෙවැනි සැක සහිත නෝට්ටුවක් දුටු සැණින් එය ළඟම ඇති පොලිස් ස්ථානයට දැන්වීමයි. විශේෂයෙන්ම පෙර කී ප්‍රදේශවල වෙසෙන ජනතාවත් ව්‍යාපාරික කටයුතුවල යෙදෙන අයත් මේ ගැන වැඩි වශයෙන් සැලකිලිමත් වීම වටී.

මේ හොර දාහේ නෝට්ටුව ඉදිරියේදී තවත් කී දෙනෙකු “අමාරුවේ දමනු ඇත්දැයි” සැක සහිතය. එම නිසා මේ ප්‍රශ්නයේදී අන් සෑම දෙයටම වඩා වැදගත් වන්නේ විමසිලිමත් බවයි.

**රසික ජයකොඩි**

**ඡායාරූප :**

**චමිල කරුණාරත්න**